# නිර්මාණ Nirmana

## නුවර ඇසළ පෙරහැර සිරි!

කුඩ කොඩි සේසත් පිරිවරා
ඇතුපිට වොරළුණ රන් කරඬුවේ
වැඩ සිටින දළදා හාමුදුරුවන් උතුම්
ගෙනදේ බොදුහද නොහිම් බැති හැඟුම්
නැගී සාදු ගොස ගුවන්තල පුරා
අනේක වර්ණයෙන් ජ්වලිත පහනින්
දෙනෝ දහක් සිත් තුටින් උතුරවා
රඟන් නැටුම් නළු පිරිස් සුපසන් ලෙසින්
එය වෙයි මිහිබට රැයක් ආ සුරපුරෙන්

♦ *විනෝදනී සේරම්* Melbourne Aus.

## වීර සෙබළ පුතුනි !

ලබාගන්නට දැයේ නිදහස
මහා බ්‍රිතනියෙන් එදා
සහෝදරයින් ලෙසින් එක්වී
එකට වැර වීරිය යොදා
දහා දුක් විඳ ලැබූ නිදහස
තිබුණ මුත් හද තුළ රඳා
මහා සටනක් පටන්ගෙන ඇත
දෙමළ ජාතිකයින් මෙදා

දෙමළ සිංහළ කියා වෙනසක්
නැතුව ලබුවත් සැල කිලී
කඩාගන්නට රටෙන් කොටසක්
දෙමළ ජාතින් වී ලොලී
වවාගෙන උන් හදේ දිව රෑ
කුරිරු විසකුරු සිතු විලී
විනාසයකට හෙලා ඇත රට
කිසිවෙකුට නැත සැන සිලී

දසක තුනකට ළඟයි දැන් ලක්
බිමේ යුද ගිනි ඇවි ලිලා
උතුරුකරයේ තිබුණු සරුබිම්
සතුට සාමය වැන සිලා
දෙමළ සිංහළ දරු කැලක් ඉන්
ගියේ රටටම නැති වෙලා
අහිංසකයින් දකුණෙ මියයති
බෝම්බත් එහි පිපි රිලා

සොළී සතුරන් ඉන්දියාවෙන්
පැමිණ අනුරා පුර වරේ
එදා රජකම් කළත් රුහුණට
ළං වුණේ නැත කිසි වරේ
හදා නිජබිම් කියන සංකල්පයක්
බොරුවට මේ වරේ
විනාසයි මේ කරන සටනින්
මුළු රට ම අද අන තුරේ

මුදාගන්නට උපන් මව්බිම
සටන්කරනට පෙර මුණේ
දිවා රෑ දුක් විඳින කැපවී
වීර සිංහළ දරු වනේ
සදා සිහි කර එදා යුද කළ
ගැමුණු රජිඳුගෙ දැ සෙනේ
නොබා පෙරටම යන්න ආපසු
නොගෙන පියවර කිසි දිනේ

බේරගන්නට සෙබළ සොයුරන්
සමග කඳවුර රුපුන ගෙන්
පිදූ තම ජීවිතය හසලක
ගාමිණී සුරු විරු පුතුන්
නගාගත් විට නිතර සිහියට
නොමඳ ජීවය එයි සැනින්
සදා මුළු ජාතියම ඔබ හට
ණයගැතියි පවසමි බැතින්

*විශ්‍රාමලත් විදුහල්පතිනි*
♦ *ප්‍රේමා අදිකාරි* Surrey UK

## රන් කැටි පුතා කෝ කෝ ?


පිරිත් සජ්ජායනා ගෙය පුරා රැව් නැගෙන
පිච්ච මල් වට්ටියද, බුදු පහන තෙල් සිඳුණ
කුරුලන්ට කෑම දෙන මිදුලෙ කොණ මැටි බඳුන
බත් ලැබී නැහැ නොවෙද සුදු පුතා අද කොතැන?

ගේ පුරා දුව දුවා පැය ගණන් දත් මදින
උණුවතුර බේසමේ වතුර ටික ඇල් මැරුණ
කලුටත් පාළු ඇති තනිකමට උඩු බුරන
පූස් පැටවුන් සොයන් සුදු පුතා නැහැ ගෙදර

පාට කළ චිත්‍රයෙහි අම්මි හැඩදැයි අසන
නැහැ කියා කීවොතින් මුල්ලකට වී හඬන
හපනාගෙ පත්තරය ගේ පුරා පිටු පිරුණ
කොහේ හෝ ගිහිං මැයි මගේ ගෙයි පිං සුවඳ

ජීවිතේ දිනෙක ඔබ හැර දමා ආ ලෙසින
සිටි හැකිද මේ තරම් ආදරය සහව ගෙන
සුදු පුතේ අම්මි ඔබෙ වරක් බලලා යන්න
මග බලන් හිඳින්නෙමි සුවඳ අරගෙන එන්න!

♦ *තුෂාරා එස්. පෙරේරා* Cyprus



## අසිරිමත් එක රැයක් !

බෙර සක් නලා දෙසවන් පිනවමින් වයයි
වන්නම් දහඅටම නටමින් ගැයුම් ගයයි
සැරසිලිවලින් ලොව ඇත්තේ මුලින් මෙයයි
රජ දරුවන්ට අප මුළු හදවතින් ණයයි

ආතත විතත විතතාතත ඝන සුසිර
අවුරුද්දකට පසු සවනට දෙයි මිහිර
විඳිනට රස පහස මොහොතක් හිඳ මෙතෙර
දස දහසින් ඇදෙති නොරටුන් මහ නුවර

අබිමානවත් ලෙස නිළමේ ගමන් කරයි
ඇත් පෙළ නිසා සිත් එඩිතරකමින් බරයි
මුල සිට අග පෙනෙනු නැත ඒ තරම් දුරයි
දළදා සමිඳු රන් කරඬුව කැළුම් පෙරයි

කිත් ගොස මැදින් මඟුලැතු පා ඔස වන්නේ
උත් තම දන්ත දා සමිඳුන් වැඩ ඉන්නේ
තෙත්කොට කොපුල් තුටු කඳුලැලි වැගි රෙන්නේ
සිත් විල් පුරා දැ බැති මල් පුබු දින්නේ

සිරි වනනට ගියොත් වසරක් හමාරය
ඉපදෙන පහන් සිතිවිලි පෙළ උදාරය
මුදු සුවයක් දෙමින් විසිරෙයි සමීරය
සැඩ රැස් නොමැති දහවල මෙනි එදාරය

♦ ගම්පහ *-පිලික්ස් ඩී. ප්‍රනාන්දු*
යක්කල Sri Lanka

## වෙන්නායිහිදි....

පේන තෙක් මානයේ
එක පුංචි ඉඩක්වත් නොහැරා
සාදා ඇත ඔවුන්
කුඩා සෙල්ලම් ගෙවල් මෙන්
විවිධ තරාතිරම්වල ගොඩනැගිලි

පසක් වෙයි මට
මෙසේ උසක සිට බලද්දී
ගෙවල් නොවේ
ගොඩනැගිලිය ඒවා
සරීර තිබු පමණින්
මිනිසුන් නොවේ ඔවුන් සැවොම.

නුපුරුදුය මුළු ලෝකයම
එහෙත් ඉඳහිටකවත්
මෙයිට කලින් කොහේදෝ හෝ
හමුවී ඇති සුළං රැළක් පමණක් විත්
ගත දැවටී පලා යයි.

එවන් සුළං රැලක් ඇවිත්
ලොව හැම අස්සක මුල්ලකම
හිතවත්කම් දැන හැඳිනුම්කම්
අළුත් කරද්දී හිතට දැනෙයි
මහත්වූ සැනසිමක් !

♦ *මහින්ද ප්‍රසාද් මස්ඉඹුල*
ගොඩකවෙල Sri Lanka


## මගේ සඳ ඔබ

මඳහාස පිරුණු නිල් නුවන් අගින්
ජීවිතේ සුවඳ යාද දුර යොදුන්
අර එබිලා බලන පුරහඳට යටින්
ඔබ එන්න ඉන්න මගේ සඳ ලෙසින්

දුක කඳුළු රැඳුණු නෙතු කොනක යටින්
ජීවිතය රැගෙන මල් සුවඳ මතින්
කටු ඇනෙන දෙපය ගෙන පරිස්සමෙන්
බිම වැටුණු තරුව අහුලගමු සෙමින්

සඳ පව්ව ගිරග කින්නරන් පෙමින්
හී සැරෙන් තැවුණ මින්දදත් තුටින්
මුදු වසන්තයට වේවී රැය පහන්
ඔබ තවම කිමද හැංගිලා හොරෙන්

♦ *නිශ්ශංක හපුආරච්චි*
බලංගොඩ Sri Lanka



## දළදා පිහිට ලැබේවා!

රටට දැයට ජනතාවට සෙත සලසන නිතිනී
දුකට සහන දෙන දළදා හිමියනි ඔබ තෙදිනී
රටට යෙදුණු සතුරු විපත් හිරු දුටු පිනි ලෙසිනී
හෙටට මැකී නැතිවේවයි පතනෙමි තිර බැතිනී

රටට විනාසය ගෙනෙනා සතුරන් ඇත උතුරේ
උනට නොමැත කරුණාවක් තිරිසන් ගති නොහැරේ
දැයට දෙමින් දිරි රුපු අවසන් වන්නට නුදුරේ
ඔබට කියමි පිහිටද අයදිමි දිව රෑ නිතරේ

♦ *රුචිරා කුමුදුනි නානායක්කාර*
Mitchum Surrey UK

## පෙරහැර වරුණ !

නුවර පෙරහැරේ අසිරිය
කියම් මම් කෙසේ
එය බලන්න දෙනෝදහක්
ඇදී එති තොසේ
නැටුම් බලා සිතින් ලොලා
පුදම් තුති බොහෝ
කුමට දැස නුදුටු මෙවන්
පෙරහැරක් අහෝ !

♦ *විජිත නාකුළුගම*
*කොළඹ 8*

## නික්ම ගිය මහැදුරුතුමනි !

**දුගඳ හමනා කුණු කානුවේ**
**මහා මන්දිර සඳළු තලයේ**
**පෙනෙන ලෝකෙන් එහා දුර සිට**
**නොපෙනෙනා ලොව සැරිසරා**
**ලොවේ පවතින සත්‍යය හෙළි කළ**
**මුළු ලොවට මහැදුරු**
**හෙළයේ මහරු මිණ**
**අප සැවොම ආදරය කළ**
**පුංචි මිනිසා ඔබය අපගේ**
**ඒත් .......**
**නැවත එන බවක්වත් නොකියා**
**සිදු කළ ඔබ නික්මයාම**
**කෙසේ නම් අප දරාගන්නද?**
**අහෝ ඔබ නොමැති පාළුව**
**පොඩි අපට තදින් දැනෙනා බව**
**ඔබ දනී නම් .......!**

*(මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා වෙනුවෙනි)*

♦ *වසන්තා කුමාරි දසනායක*
මයිලවලාන කිරිඳිවැල
Sri Lanka

## වියපත් බිරිඳකගෙන්

අපට වැඩියෙන් සීරුවට ගොම්මනේ අඳුර
වෙලාගෙන අප දැත නිසොල්මන් අවරටම
සනහමින් සියොළඟම පුරුදු පිල්කඩ හිඳන්
හැරමිටිය දන්නවයැ අප දුටුව පෙම් හීන

ඉරිතැළුණ දිවි ගහේ පතුල හොරැහින් තබා
නොදරු දරු අප තුරුණු වෙස් රැගෙන ඉගිලුණා
මදින් මඳ නිවෙන තරු අඩ එළිය ඇතිරෙනා
ගිලී ගිය ඇස් වලින් පෙනේ ඉස්සර දසුන්

නැමි නැමී සැලෙන අප අඳුරු සෙවනැලි කොනේ
බාල රත්තරන් රූ මවා රන්හුය දිලේ
තෙල් බිඳට ලතැවෙමින් පණ අදින කුප්පි කට
ඉහිමරයි සුසුම් වැල් හෙලන්නට අප දෙසට

තුඩලමින් පෙම් අමා පැන් පොදක් මඳහසින
අදර වියමන් බඳින විහඟ නෙත් නිදිබරය
මස්වැදලි එකිනෙකට ඇළුණු නුඹෙ පුළුලුරේ
තබන්නද හිමිසඳුනි මහිස සෙනෙහෙන් බරව

♦ *දුලාංජලී සිරිවර්ධන*
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
Sri Lanka

## පුංචි නංගි රට ගිහින්

රෑ කළුවර ගස් ගොම්මන හොල්මන් ඇති නංගියේ
මං කිච්චම අම්ම ළඟින් හෙල්ලුන්නැති නංගියේ
වැස්ස දා ට අකුණු හඬට බයේ ගැහුණ නංගියේ
උඹ කොහොමද අපිව දාලා අහස්යන්තරෙන් ගියේ

කිරි කළ හත නාල පිලෙන් ගෙඩ ගොඩවුණු වංගියේ
සිරියාවට තෙල් පානට හිනාවෙච්ච නංගියේ
මතක් වෙද්දි වෙච්ච සිද්දි අපේ පුංචි සංදියේ
හිතේ දුකට පපු කැනැත්ත කීරි ගැහෙයි නංගියේ

බීපු කෙනෙක් පාරෙ ගියොත් ගෙටම දුවපු නංගියේ
අමුත්තෙකුට මූණ නොදී වහං වෙච්ච නංගියේ
ගමෙන් පිටට කිසිම දාක පය නොතිබ්බ නංගියේ
ඒරොප්පෙක කුස්සියකට සින්නවෙලා පොච්චියේ

♦ *ශ්‍රියා කුමාරසිංහ*
New Zealand

## රෑ සුන්දරියකගේ කවිය

**මලානික හඳ එළියෙ වීදියේ කෙළවර ට**
**මහා මැදියම් රැයේ කඩපිළේ අගුවක ට**
**තිළින කොට මල් පිපෙන තුරුණු විය කළුවර ට**
**සිනාසෙමි හෙට දවස උරුමකොට කඳුළ ක ට**

**සිදාදියෙ මැදුරකට ගිය දිනක මෙහෙවර ට**
**බිලිදුනිමි යෞවනය මත් සළෙල බඹරෙකු ට**
**මහමෙරද නොසෙල්විණ හෙලූ දුක් සුසුමක ට**
**මිලින විය පෙම් සිහින රතුරෝස කුසුමක ට**

**තලා පොඩිකර දමා මගේ මුදු මල් පෙතී**
**උරාගත් රොන් බිඳක සුවය නම් මට නැතී**
**ඔබේ සිත මට එපා ඔබට මා හිමි නැතී**
**දෙපා මුල දමා ගිය නිල් කොළය මට ඇතී**

♦ *සන්ධ්‍යානි සේනාරත්න*
Roehampton
London SW15



## මගේ දුක

**සිප් සතර**
**හොඳ හැටිය**
**දෙනු වගට**
**සිත එඩිය**
**තිබෙන මුදු**
**ඇති දුකය**
**මට දරුවො**
**නැති එකය....**

♦ *නිරංජලා මනෝහාරි*
Cyprus

## උතුරු බිමට ගිය එඩිතර පුතණුවනි !

අම්මා පෙවූ කිරි කඳුලක බලය නිසා
පියා දුන්න ඔවදන් වල ගුණය නිසා
ගුරුවරු පොත පතේ දැනුමද පෙවූ නිසා
යුද බිම පිවිසුනේ දෙස රැකගනු පිණිසා

අව් වැසි නොබල රට රක්නා මා සොයුරේ
අහරක් කුසට වැටුණද නුඹෙ වැඩ අතරේ
දවස් ගණන් එක වස්ත්‍රය ඇඳ නිතරේ
දැසට නින්ද නැත ගොඩ හෝ මඩ වගුරේ

උතුරු කරේ බංකරයක සිටින මලේ
තම දිවි නොබල සටනට වන් මාගෙ මලේ
අව්වට දැවී දුඹුරුව ගිය නමුදු මලේ
එඩිතර පුතෙකි නුඹ ලක්මව රකින මලේ

ගතේ ලෙඩට නැත නුඹ කිසි බිය වන්නේ
සිතේ දුකක් තිබුණත් සඟවා ගන්නේ
අප වෙනුවෙන්ය දිව රෑ නුඹ වෙහෙ සෙන්නේ
පතනෙමු දෙවි පිහිට හා තෙසරණ සරණේ

♦ *මාරවිල - ඈන් ප්‍රියාංගනී*
Nicosia Cyprus